# 2023/07/13 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/07/13 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරි ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරි ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරි ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරි කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරි පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/06/22 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද මාර්ග සඳහා ගෙවීම් කිරීම වෙනුවෙන් එවන ලද රු:958,932.47 මුදලින් පහත සඳහන් වවුචර්පත් උපලේඛණ ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘති අංකය | නම සහ විස්තරය | ගෙවන මුදල(රු:) | කමිටු තීරණය |
|---|---|---|---|---|
| 01 | LA/22/21/CC/373 | සභාපති, ඉලුක්පිටිය ගොවි සංවිධානය, කමිටු අංක 04, කෝමාරික ඇල ව්‍යාපාරය,මීගහකිවුල - 32 කෙත් ඇල මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ අවසන් බිල්පතේ දෙවන කොටස ගෙවීම. | 78,533.53 | නිර්දේශ කරන ලදී. |
| 02 | PO/22/21/CC/07 | සභ ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - ග්‍රාමීය මාර්ග වැඩ සටහන 2021 යටතේ කළුගහකඳුර කපුවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අතරුඳවුම් මුදල 10% ගෙවීම සඳහා සභා අරමුදලින් ලබා ගත් මුදල් නැවත එම ගිණුමට පියවීම. | 195,936.57 | නිර්දේශ කරන ලදී. |
| 03 | LA/22/21/CC/373 | සභාපති, ඉලුක්පිටිය ගොවි සංවිධානය, කමිටු අංක 04, කෝමාරික ඇල ව්‍යාපාරය,මීගහකිවුල - 32 කෙත් ඇල මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ 10% අතරුඳවුම් මුදල නිදහස් කර ගෙවීම. | 64,959.06 | නිර්දේශ කරන ලදී. |
| 04 | PO/22/21/CC/11 | සභාපති, දිලෙනතරු ග්‍රාම සංවර්ධන සමිතිය, මීගහකිවුල - ග්‍රාමීය මාර්ග වැඩ සටහන 2021 යටතේ කළුගහකඳුර වැද්දන්නේවෙල හැමතැන්නේගෙදර දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට අදාළ 10% අතරුඳවුම් මුදල නිදහස් කර ගෙවීම. | 194,849.09 | නිර්දේශ කරන ලදී. |
| 05 | LA/22/21/CC/372 | සභාපති, ගොඩයාගම ගොවි සංවිධානය,ගොඩයාගම මීගහකිවුල - ග්‍රාමීය මාර්ග වැඩ සටහන 2021 යටතේ කැන්දලන්ද ගම මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන 10% අතරුඳවුම් මුදල | 197,105.18 | නිර්දේශ කරන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| 06 | LA/22/21/CC/402 | සභාපති, රශ්මිකා ග්‍රාම සංවර්ධන සමිතිය, තල්දෙන - ග්‍රාමීය මාර්ග වැඩසටහන 2021 යටතේ කරදපිටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අවසන් බිල්පතට අදාළ 10% අතරුදවුම් මුදල් නිදහස් කිරීම. | 65,587.67 | නිර්දේශ කරන ලදී. |
| 07 | CM/22/21/CC/1129 | සභාපති, පොල්ගහඅරාව ග්‍රාම සංවර්ධන සමිතිය, පොල්ගහඅරාව,අරාව - ග්‍රාමීය මාර්ග වැඩසටහන 2021 යටතේ කරදගහමඩ පස්සර අරාව මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ අවසන් බිල්පත සඳහා වන 10% අතරුදවුම් මුදල නිදහස් කර ගෙවීම. | 95,891.38 | නිර්දේශ කරන ලදී. |
| 08 | LA/22/21/CC/1468 | සභාපති, කෝමාරික ඇල ව්‍යාපාරය අංක 05, ගොවි සංවිධානය, බලගොල්ල - ග්‍රාමීය මාර්ග වැඩසටහන 2021 යටතේ සමගි වික්‍රම මාවත කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අවසන් බිල්පත සඳහා අතරුදවුම් මුදල නිදහස් කර ගෙවීම. | 66,069.99 | නිර්දේශ කරන ලදී. |
| **එකතුව** | | | **958,932.47** | නිර්දේශ කරන ලදී. |

b. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 1 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පසුගිය පැවති 2022/06/22 කළමනාකරණ කමිටුව හා ප්‍රසම්පාදන කමිටු දීමනා ගෙවීම. | 13,000.00 | නිර්දේශ කරන ලදී. |
| 2 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | 9,820.00 | නිර්දේශ කරන ලදී. |
| 3 | බී.එම්.හිරන්ත ලක්ෂාන් මයා කාර්මික නිලධාරී(පුහුණු), ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023 මාර්තු මස සංයුක්ත දීමනාව ගෙවීම. | 5,346.00 | නිර්දේශ කරන ලදී. |
| 4 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මැයි මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු සඳහා ක්ෂේත්‍රය වෙත යෑම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,600.00 | නිර්දේශ කරන ලදී. |
| 5 | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2023 ජූනි මස 16 සිට 30 දක්වා ඉන්ධන ලබා ගැනීම. | 53,654.00 | නිර්දේශ කරන ලදී. |
| 6 | එස්.එම්.නවෝදා දිලිනි මෙය, සංවර්ධන නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ වෙන්දේසිය සඳහා පැමිණි නිලධාරී මහතුන් හට දිවා ආහාරය ලබා දීම සඳහා අතින් දැරූ මුදල් ලබා ගැනීම. | 2,250.00 | නිර්දේශ කරන ලදී. |

c. පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ අංක 010100179027344 ගිණුමට බැර - නිදහස් තැපැල් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් පිටමාරුව පුංචි ලෝකාන්තයේ මුදල් අයකැමි හා මුරකරු ලෙස සේවය කරන ඩබ්.කේ.එච්.නුවන් මහතා හට පිටමාරුව පුංචි ලෝකාන්තයට යාම සඳහා විශාල ගමන් වියදමක් දැරීමට සිදුවන බැවින් හා විශාල කාලයක් එහි රැඳී සිටීමට සිදු වන නිසා ඔහුගේ ඉල්ලීම සලකා බලා උපරිම පැය 20ක සීමාවකට යටත්ව අතිකාල දීමනා ගෙවීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ජල පිරිපහදු ඒකකය හා ලේඛනාගාරයෙහි partition කිරීම සඳහා BSR සටහනෙහි සඳහන් දෛනික වැටුප් පදනම මත ඇලුමිනියම් පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් යොදවා ගැනීම සඳහා සකස් කරන ලද දළ ඇස්තමේන්තුව සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභවේ 2023 ජුනි මස මාසික ආදායම් සාරාංශය සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

V. මීගහකිවුල ප්‍රාදේශීය සභවේ 2023 ජුනි මස මාසික ගෙවීම් සාරාංශය සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තූති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.10.30ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) - Nishanthi
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
5) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
6) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -